# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1987/51 - 2016 ඔක්තෝබර් මස 07 වැනි සිකුරාදා - 2016.10.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

විධාන අංක 62

**2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත**

10(1)(අ) වගන්තිය යටතේ විධානය

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 10(1)(අ) වගන්තිය මගින් පැවරී ඇති බලතල ප්‍රකාරව කටයුතු කරමින් බෝතල් කළ, ඇසුරුම් කළ හෝ බහාලුම්ගත ආහාරයට ගන්නා සියළු තෙල් වර්ග සිල්ලර හෝ තොග වශයෙන් විකුණනු ලබන සියළු නිෂ්පාදකයින්, ආනයනකරුවන්, බෙදහරින්නන් හා වෙළෙඳුන් වෙත, එකී ආහාරයට ගන්නා තෙල් වර්ගයන්හි බෝතල්, ඇසුරුම් හෝ බහාලුම්වල පහත සඳහන් තොරතුරු පැහැදිලිව මුද්‍රණය කළ යුතු බවට මෙයින් විධාන කරනු ලැබේ.

(අ) කාණ්ඩ අංකය
(ආ) නිෂ්පාදිත දිනය
(ඇ) කල් ඉකුත්වන දිනය
(ඈ) පරිමාව/බර
(ඉ) උපරිම සිල්ලර මිල
(ඊ) නිෂ්පාදකයාගේ නම හා ලිපිනය
(එ) එය ආනයනය කරන ලද්දක් නම්, ආනයනකරුගේ නම හා ලිපිනය හා ආනයනික රට
(ඒ) එය තොග වශයෙන් ආනයනය කර නැවත අසුරා ඇත්නම්, නිෂ්පාදිත දිනය හා නැවත ඇසුරුම් කළ දිනය
(ඔ) එය මිශ්‍රිත තෙල් වර්ගයක් නම්, මිශ්‍රණයේ අඩංගු තෙල් වර්ගවල හා ඒවා අඩංගු ප්‍රතිශතයන් පිළිබඳ විස්තරයක් සමඟ එය මිශ්‍රිත/කළවම් කළ තෙල් බවට වන ප්‍රකාශයක්,

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් 2003 අගෝස්තු මස 25 වැනි දින හා 2005 අගෝස්තු මස 26 වැනි දින පිළිවෙලින් අංක 1301/1 හා 1407/23 යටතේ ලංකාණ්ඩුවේ *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත් කරන ලද විධාන අංක 02 හා 04 යන විධානයන්හි ''ඇසුරුම් කළ හෝ බහාලුම්ගත කෑමට ගන්නා තෙල් '' යන්න මෙමගින් ඉවත් කරනු ලැබේ.

මෙම විධානය වර්ෂ 2017 මාර්තු මස 01 වැනි දින සිට බලපැවැත්වෙනු ඇත.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණ පරිදි,

හසිත තිලකරත්න,
සභාපති.

2016 ඔක්තෝබර් මස 07 වැනි දින,
කොළඹ දී ය.

10-1236

1A - PG 3166— 207 (2016/10) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*